**ශීර්ෂය - 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය නොකළ මතය

ශීර්ෂය - 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 28 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කලමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුළ කුණ්ඩසාලේ කෘතිම සිංචන මධ්‍යස්ථානය මඟින් පළාත් සභාවන් වෙත නිකුත් කරන ලද ගව ශුක්‍ර වඩි සඳහා රු.12,398,310 ක් අයකර ගෙන නොතිබුණි. | ගව ශුක්‍ර වඩි ගොවීන් වෙත අඛණ්ඩව සපයන අතර එම රැස්වන ආදායම් පළාත් සභාවට එවීමට යම් කාලපමාවක් ගතවන බැවින් හිඟයක් නිරන්තරයෙන් පවතින බව | කාලපරිච්ඡේදයට අදාළ ආදායම් නිවැරදිව අයකරගත යුතුය. |

### 2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | රාජ්‍ය සේවා කොමිෂම විසින් 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්යය පටිපාටික රීති මාලාවේ XVIII ඡේදයේ 193 වන අනුඡේදය | - | සේවාකාලය වසර 05 කට වඩා වැඩි සෑම රජයේ නිළධාරීයෙකුම ස්ථාන මාරුවීම්වලට යටත් විය යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකර පරීක්ෂණයට භාජනය වූ උපකාර්යාල 04 ක වසර 07 සිට වසර 28 දක්වා කාලයක සිට නිලධාරීන් 25 දෙනෙකු එකම සේවා ස්ථානයේ සේවයේ යොදවා ගෙන තිබුණි. | වසර 05 ක් ඉක්මවුවත් ඇතැම් නිලධාරින් ස්ථානමාරු ඉල්ලුම් කර නොතිබීමත් හා ස්ථාන මාරුව සඳහා සුදුසු අනුප්‍රාප්තිකයෙකු නොමැති බව | කාර්යය පටිපාටික රීති ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | | |
| XV පරිච්ඡේදයේ 4 වන වගන්තිය | 6,199,106 | අධ්‍යාන, අභ්‍යාස හෝ රාජකාරී කටයුතු සඳහා විදේශගත වූ නිලධාරීන් 08 දෙනෙකු නැවත සේවයට වාර්තා කර නොතිබීම හේතුවෙන් අනිවාර්ය සේවා කාලයක් සේවය කිරිම සඳහා එළඹි ගිවිසුම කඩකිරීම නිසා එම නිලධාරීන්ගෙන් අයවිය යුතු දඩ මුදල් අයකරගෙන නොතිබුණි. | නිලධාරීන් 04 ගෙන් වාරික වශයෙන් මුදල් අයකරගන්නා බව | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාලව පිළියෙල කළ ක්‍රියාකාරි සැලැස්ම අනුව සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් 23 කට අදාළ උප ක්‍රියාකාරකම් 42 ක ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු මට්ටමක පැවතුණු අතර ක්‍රියාකාරකම් 18 ක උප ක්‍රියාකාරකම් 24 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාළ කාල සීමාව තුල වාර්තා වූ රෝග විමර්ෂණ වාර්තා නැවත විමර්ෂන කටයුතු සඳහා යොමු කර ඇති බව හා ක්‍රියාකාරකම් 04 ක් සම්බන්ධයෙන් ප්‍රමාණවත් පරිදි රෝග තත්ත්වයන් වාර්තා නොවූ බව | සැලසුම් කල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කල යුතුය. |
| (ආ) | කොළඹ සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථානය තුළ ප්‍රමාණවත් විද්‍යාගාර පහසුකම් නොමැති විම හේතුවෙන් ලබාගත් සත්ත්ව සහ සත්ත්ව ආහාර සාම්පල් 1,057 ක් අතුරින් 850 ක් ගන්නෝරුව පශු පර්යේෂණ ආයතනයටත්, 187 ක් වැලිසර පශු පර්යේෂණ මධ්‍යස්ථානයටත් ලබා දි පරීක්ෂා කර තිබුණි. මෙම පර්යේෂණ කටයුතු සඳහා විශාල කාලයක් ගතවන බැවින් සත්ත්ව හා සත්ත්ව ආහාර ආනයනය හා අපනයන කටයුතු කෙරෙහි අහිතකර බලපෑමකට ඇති ඉඩකඩ බැහැර කළ නොහැකි විය. | විද්‍යාගාරය වැඩි දියුණු කිරීමට අවශ්‍ය රසායනාගාර ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා සුදුසු ප්‍රසම්පාදන ක්‍රමයක් අනුගමනය කරන ලෙස ස්ථානභාර නිලධාරී වෙත උපදෙස් ලබා දී ඇති බව | ප්‍රමාණවත් විද්‍යාගාර පහසුකම් නිරෝධායන මධ්‍යස්ථානය තුල ස්ථාපිත කළ යුතුය. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021, 2022 හා 2023 වර්ෂවලදී තෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානයේ පැටව් උපත් සංඛ්‍යාව පිළිවෙලින් 182, 35 හා 108 ක් දක්වා අභිජනන ක්‍රියාවලිය වර්ධනය අඩු මට්ටමක පැවතීමෙන් උසස් නිෂ්පාදන හැකියාවන් ඇති පට්ටි එළුවන් ජාතික එළු ගහණයට එකතු කිරීමේ අරමුණ ඉටු වී නොතිබුණි. | සතුන් අතර පවතින මන්ද පෝෂණ තත්ත්වය හේතුවෙන් නැවත මෙම සතුන් පට්ටියට පැමිණීම අඩු මට්ටමක පැවති බැවින් ගැබ් ගැනීමේ ප්‍රතිශතය අඩු වී ඇති බව | ව්‍යාපෘතියේ සැලසුම් කළ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3. අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසරකට 50 බැගින් වසර 05 ක් තුල එළුවන් 250 ක් ක්ෂේත්‍රගත කිරීමේ අරමුණින් 2019 වර්ෂයේදී ඉඹුලන්දණ්ඩ එළු අභිජනන මධ්‍යස්ථානය තුල බෝයර් වර්ගයේ එළු අභිජනන ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂය අවසන් වන විට රු.91,970,290 ක වියදමක් දරා තිබුණු අතර එම කාලය තුළ රු.2,362,442 ක ආදායමක් පමණක් ලබා ගෙන තිබුණි. එසේම මෙම කාලය තුල එළුවන් 23 ක් පමණක් ක්ෂේත්‍රයට නිකුත් කර තිබුණු බැවින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු වි නොතිබුණි. | නිරෝධායන කාල සීමාව තුළ B/T හා CAE ප්‍රතිදේහ හමුවීම නිසා ආනයනික එළු කණ්ඩායම විටින් විට පරීක්ෂා කළ අතර රෝග කාරක සහිත සතුන් හමු වූ අතර ඒ අනුව ක්ෂේත්‍රයට මේ වන විට සතුන් නිකුත් කිරීම නතර කර ඇති බව | රෝග පාලනයත් සමඟ ව්‍යාපෘතියේ සැලසුම් කල අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | තෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානයේ සතුන්ගේ රෝග විනිශ්චය, රෝග නිර්ණය සහ රෝග මර්ධනය යන රාජකාරී නිසිලෙස ඉටුකොට සතුන්ගේ සෞඛ්‍ය තත්ත්වය තහවුරු කර ගැනීම සඳහා පත්කර තිබුණු වෛද්‍යවරයෙකු අභිජනන මධ්‍යස්ථානයේ රාජකාරී සඳහා 2022 වර්ෂයේදී දින 03 ක් වැනි සීමිත දින ගණනක් හා සමාලෝචිත වර්ෂයේ දින 23 ක් මධ්‍යස්ථානය නිරීක්ෂණය කර තිබුණි. ඒ අනුව එම වෛද්‍යවරයාගේ අපේක්ෂිත රාජකාරී ඉටු වී නොතිබුණු අතර එම කාල පරිච්ඡේදය තුලදී සතුන් මිය යාමද පිළිවෙලින් 141 ක් හා 35 ක් ලෙස ඉහල අගයක් ගෙන තිබුණි. | 2022 වර්ෂය තුළ පැවති අර්බුදකාරී ආර්ථික වතාවරණය තුළ පොදු ප්‍රවාහනය භාවිතා කිරීමේ අපහසුතා මෙන්ම පැවති ඉන්ධන හිඟය වැනි නොවැළැක්විය හැකි හේතු නිසා ප්‍රධාන කාර්යාලයේ සිට පශු වෛද්‍යවරුන්ගේ සේවය අඛණ්ඩව එම තෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානය වෙත සැපයීමට නොහැකි වූ බව | අභිජනන මධ්‍යස්ථානය සඳහා පහසුවෙන් ලඟාවිය හැකි වෛද්‍යවරයෙකු වෙත රාජකාරී පැවරිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයේ 2018 වර්ෂයේදී ඩිප්ලෝමාධාරියෙකු බිහි කිරීම වෙනුවෙන් දරන ලද වියදම රු.600,000 ට ආසන්න අගයක් ගෙන තිබූ අතර 2019 – 2022 අතර කාලය තුලදී එය ලක්ෂ 11 සිට ලක්ෂ 18.5 දක්වා වැඩි වී තිබුණි. එක් ඩිප්ලෝමාධාරියෙකු වෙනුවෙන් වර්ෂයයකට දරන පිරිවැය අවම කර ගැනීම සඳහා ලියාපදිංචි කර ගන්නා සිසුන් ප්‍රමාණය වැඩි කිරීම , පාඨමාලාව හැරයාමේ ප්‍රමාණය අවම කර ගැනීමට ක්‍රියා කිරීම එක් එක් වැය විෂයයන් වෙනුවෙන් දරන ලද වියදම් අවම කර ගැනිම වැනි ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | වියදම් කළමනාකරණය කර පාඨමාලා හැර යන සිසුන් අවම කර කාර්යක්ෂමතාව වැඩි කල යුතුය. |

**3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික කාර්යසාධන වාර්තාව, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් 2024.01.03 දින එවන ලද ඉල්ලීමට අනුව හා එම අමාත්‍යාංශය විසින් එවන ලද ආකෘතියට අනුරූපව සකස්කර අමාත්‍යාංශ ලේකම් මගින් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යාංශයේ, සැලසුම් අංශය වෙත 2024.02.05 දින යවා ඇති බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |

**3.5 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයේ එක් අධ්‍යයන වර්ෂයකට සිසුන් 100 දෙනෙකු පුහුණු කිරීම සඳහා අවශ්‍ය සම්පත් පැවතියද 2019 – 2022 හා 2022 – 2024 අධ්‍යන වර්ෂ දෙක වෙනුවෙන්ම සිසුන් 137 ක් පමණක් ලියාපදිංචි වීමෙන් පවතින සම්පත් ඌණ උපයෝජිතව තිබුණි. | මෙම විද්‍යාලයේ දේශනශාලා පුළුල් කිරීම තුළින් එක් ශිෂ්‍ය කණ්ඩායමක් සඳහා සිසුන් 75 දෙනෙකු බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට අදහස් කරන බව | පවතින සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රු.11,611,665 ක වියදමක් දරමින් 2021 ජනවාරි 04 දින වැඩ නිම කරන ලද අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේ ආපනශාලාවේ ඉහල මහල වසර තුනකටත් අධික කාලයක සිට අපේක්ෂිත අරමුණට යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | 2024 වර්ෂයේ කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම් යටතේ ඇති ප්‍රතිපාදන මඟින් මෙම අවශ්‍යතා වලින් කොටසක් හෝ ලබා ගැනීමට උත්සාහ දරන බව | අපේක්ෂිත අරමුණට අදාළව ගොඩනැගිල්ල භාවිතයට ගත යුතුය. |
| (ඇ) | මධ්‍යම කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානයේ කුකුලන් 5,181 ක උපරිම ධාරිතාවයකින් පවත්වාගෙන යාමට හැකි කුකුල් නිවාස හා සම්පත් පැවතියද සමාලෝචිත වර්ෂය තුලදී කුකුලන් 1,680 ක් එනම් සියයට 32 කට අඩු ප්‍රමාණයක් නඩත්තු කිරීම තුලින් මධ්‍යස්ථානය සියයට 68 ක් ඌණ උපයෝජිතව පැවතුණි. | ගොවිපලෙහි කුකුළන් 5000 ට වැඩි ප්‍රමාණයක් ඇති කිරීමට තරම් කුකුල් නිවාසවල ඉඩකඩ පවතින නමුත් බීජරක්වනාගාරයේ ධාරිතාවය ඇත්තේ බිත්තර 8400 කට පමණක් බැවින් බීජ රක්වනාගාරයට අවශ්‍ය setter යන්ත්‍රය මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව | කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානය උපරිම ධාරිතාවයකින් පවත්වාගෙන යායුතුය. |

**3.6 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගන්නෝරුව පශු පර්යේෂණ ආයතනයේ මුදල් භාරකාරිනිය (සරප්) විසින් 2018 සිට 2023 ජූලි මස දක්වා කාලය තුළ දෛනිකව රැස්කරගනු ලබන ආදායමින් රු.14,749,160 ක මුදලක් ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන මුදල් භාරකරු වෙත භාර නොදී පෞද්ගලික පරිහරණයට ලබාගෙන අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි.මෙම මූල්‍ය අක්‍රමිකතාවය සම්බන්ධව මු.රෙ.104(4) පූර්ණ පරීක්ෂණ වාර්තා සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් නිකුත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |

### 3.7 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පිළියෙල කල මූල්‍ය ප්‍රකාශන අනුව අවස්ථා 18 කට අදාළව එකතුව රු.21,299,643 ක පාඩු හා හානි සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මු.රෙ. 104(3) යටතේ අලාභයන් පිළිබඳ ප්‍රාරම්භක පරීක්ෂණ වාර්තා හා 104(4) යටතේ අලාභයන් පිළිබඳ අවසාන වාර්තා ලබා ගැනීම අනුව ඉදිරි කටයුතු සිදුකිරීමට අපේක්ෂා කරන බව | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |

### 3.8 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පොල්ගොල්ල සත්ත්ව විෂාණු රසායනාගාරය සඳහා 2022 අගෝස්තු 15 දින රු.96,548,000 ට ස්වයංක්‍රීය ජෛව ප්‍රතිකාරක යන්ත්‍රයක් මිලදී ගෙන සවිකර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින තෙක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | 2021 වසරේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත මෙම මිලදී ගැනීම සිදු කර ඇති බව | අවශ්‍යතාවය මත මිලදී ගැනිම් සිදු කර යන්ත්‍රය භාවිතයට ගත යුතුය. |
| (ආ) | කරදගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයේ අධ්‍යන වර්ෂ 06 ක තොරතුරු අනුව ඩිප්ලෝමා පාඨමාලාව හැරගිය සිසුන්ගේ ප්‍රතිශතය සියයට 27 ක ඉහල අගයක් ගෙන තිබුණු අතර පාඨමාලාව හැර යන සිසුන් වෙනුවෙන් දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | පාඨමාලාවට ලියාපදිංචි වීමෙන් පසු වෙනත් උසස් අධ්‍යාපන කටයුතු වෙනුවෙන් හා විවිධ රැකියා අවස්ථාවන් වෙත යොමු වීම හේතුවෙන් පාඨමාලාව හැර යනු ලබන සිසුන්ගෙන් දෙපාර්තමේන්තුව ඔවුන් වෙනුවෙන් දැරූ වියදම් අයකර ගැනීමට ගිවිසුමක් සකස් කර නීති අංශය වෙත යොමුකර ඇති අතර, ඒ සඳහා විධිමත් අනුමැතියක් මේ දක්වා ලැබී නොමැති බව | පාඨමාලාව හැරයන සිසුන් ප්‍රමාණය අවම කර ගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු 03ක් වෙනුවෙන් ඉලක්ක 06 ක් කරා ළඟාවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණු අතර ඉන් ඉලක්ක 02 ක ප්‍රගතිය සියයට 50 ත් 74 අතර මට්ටමක පැවතුණි. | පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වය යටතේ අපේක්ෂිත ඉලක්ක වෙත ළඟාවීමට නොහැකි වුවත් ක්‍රමානුකූලව ඉලක්ක වෙත ලඟා වීම සඳහා අවශ්‍ය උපායමාර්ගික ක්‍රියාකාරකම් සකස් කරමින් පවතින බව | අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කල යුතුය. |

**5. යහපාලනය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මධ්‍යම කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානයේ ගොවිපලෙහි කුකුල් පැටවුන් අයදුම්කරුවන් ලියාපදිංචි කිරීම විධිමත්ව සිදු නොවන බවද පැටවුන් නිකුත් කිරීමේදී එකම පාරිභෝගික කණ්ඩායමක් වෙත කුකුල් පැටව් නිකුත් කර තිබුණු බව නිරීක්ෂණය විය. එසේම වැඩියෙන් ඉල්ලුම් කරන්නන් වෙත සැපයුම් කිරීමටත් කුඩා ප්‍රමාණයක් ඉල්ලුම්කරන ඉල්ලුම්කරුවන් වෙත පැටව් ලබා දීමට කටයුතු නොකරන බව නිරීක්ෂණය වූ අතර 2023 මාර්තු මස සිට සැප්තැම්බර් මස දක්වා කාලය තුළ එකම පුද්ගලයෙකුට සතියකට කුකුලු පැටවුන් 500 ක් බැගින් කුකුල් පැටවුන් 12,000 ක් නිකුත් කිරීමට කටයුතු කර තිබුණි. | පැටව් ඉල්ලුම්කරන සියළුම පාරිභෝගිකයන් වෙත සාධාරණයක් ඉටුකිරීම වගකීම වන නමුත් ඉල්ලුමට සරිලන සැපයුමක් නොමැති බැවින් සියලු පාරිභෝගික අවශ්‍යතා සපුරාලිය නොහැකි බව | සියලුම ඉල්ලුම්කරුවන් අතර නිසි ක්‍රමවේදයක් යටතේ පැටවුන් නිකුත් කිරීම කල යුතුය. |

## 6. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්යය මණ්ඩලය හා තථ්‍ය කාර්යය මණ්ඩලය සැසඳීමේදී පුරප්පාඩු 152 ක් පැවතුණි. දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම තුළ තනතුරු 16 ක පුරප්පාඩු 61 ක් පැවති අතර එම පුරප්පාඩු අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 08 ක්ද, පශු විමර්ශන නිලධාරි තනතුරු 07 ක්ද , පශු පර්යේෂණ නිලධාරි තනතුරු 16 ක්ද, පශු වෛද්‍ය නිලධාරී තනතුරු 09 ක් ද විය. ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 33 ක් පැවති බැවින් ක්ෂේත්‍ර කාර්යයන් කරගෙන යාමේදී අපහසුතා පැන නැගී තිබුණි | පුරප්පාඩු තනතුරු සඳහා නිලධාරීන් ස්ථිරව පත්කරන තෙක් රාජකාරි ආවරණය සඳහා නිලධාරීන් පත් කර ඇති බව | අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු පිරවිය යුතුය. |